## ශ්‍රී ලංකා වරාය අධිකාරිය - 2015

---------------------------------------

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සහ එහි පරිපාලිත සමාගම්හි 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ 33 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------------

මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 පරිපාලිත හා ආශ්‍රිත සමාගම්

----------------------------

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතුව පරිපාලිත සමාගම් දෙකක් ලෙස සීමාසහිත ජය බහළුම් පර්යන්ත සමාගම හා සීමාසහිත මාගම්පුර වරාය කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම සහ ආශ්‍රිත සමාගම

ලෙස සීමාසහිත වරාය කළමනාකරණ හා උපදේශක සේවා සමාගම පැවතුණි. මේවායේ හිමිකම් පිළිවෙලින් පරිපාලිත සමාගම්හි සියයට 100 ක් හා ආශ්‍රිත සමාගම් හි සියයට 39.97 ක් විය. මෙම සමාගම් තුනෙහි විගණනය ප්‍රසිද්ධ ගණකාධිකාරී වෘත්තියේ නියැලී සිටින වරලත් විගණන සමාගම් තුනක් මඟින් සිදුකර තිබුණි.

**1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**--------------**

**2.1 තත්ත්වාගණනය කළ මතය - සමූහය**

**-------------------------------------**

මෙම වාර්තාවේ 2.2.1 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සහ එහි පරිපාලිත සමාගම් හි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**තත්ත්වාගණනය කළ මතය - අධිකාරිය**

--------------------------------------------

මෙම වාර්තාවේ 2.2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**-------------------------------------**

2.2.1 **සමූහයේ මූල්‍ය ප්‍රකාශන**

**------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට වරාය අධිකාරිය සියයට 100 ක කොටස් හිමිකම දරන පරිපාලිත සමාගමක් වන මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගමේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතය පහත දැක්වෙන කරුණු පදනම් කරගෙන තත්ත්වාගණනය කර තිබුණි. මාගම්පුර වරාය කළමනාකරණ ආයතනය විගණනය කරන ලද පෞද්ගලික විගණන ආයතනයේ තත්ත්වාගණනය කරන ලද විගණන ඡේදය අනුව සකස් කරන ලදී.

(i) මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අයකර ගැනීම අවිනිශ්චිත රු.මිලියන 28.4 ක ලැබිය යුතු ටග් යාත්‍රා වන්දි (Tug Claim Receivables)ශේෂය තෙවන පාර්ශව ශේෂ සනාථ කිරීම මගින් තහවුරු නොකිරීම සහ අනාගතයේ සිදුවිය හැකි පාඩු සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබීම.

(ii) අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව නැව් තෙල් මෙහෙයුම් කටයුතු (Bunkering Operation) නැවැත්වීම.

(iii) සමාලෝචිත වර්ෂයේ දී සමාගම රු.මිලියන 450 ක ශුද්ධ අලාභයක් ඉපැයීම නිසා 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අලාභය රු.මිලියන 1,426 ක් සහ සමාගමේ ජංගම වත්කම් ඉක්මවූ ජංගම බැරකම් ප්‍රමාණය රු.මිලියන 1,372 ක් වීමෙන් 2007 අංක 07 දරන සමාගම් පනතේ 220(1) වගන්තිය ප්‍රකාර දැඩි ප්‍රාග්ධන හිඟයකට මුහුණ දී සිටින බව නිරීක්ෂණය විය. එහෙයින් සමාගම, අඛණ්ඩ පැවත්ම පිළිබඳ අවිනිශ්චිත තත්ත්වයක පැවතීම.

(ආ) අධිකාරියේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සමූහයට අයත් පරිපාලිත සමාගම් වන ජයබහළුම් පර්යන්තය හා මාගම්පුර වරාය කළමනාකරණ හා උපදේශන සේවා සමාගම්හි විගණනය නොකරන ලද මූල්‍ය ප්‍රකාශන යොදා ගෙන තිබුණි.

2.2.2 **අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන**

------------------------------

2.2.2.1 **ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) 07**

**-------------------------------------------------**

වගකීම් සඳහා ඇපයට තබා ඇති මූල්‍ය වත්කම්වල ධාරණ වටිනාකම හෙළිදරව් කළයුතු වුවත් ව්‍යාපෘති දෙකක් මූල්‍යයනය සහ උපකරණ මිලදී ගැනීම සඳහා රාජ්‍ය බැංකුවකින් ලබා ගන්නා ලද ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 163.4ක ණය සඳහා බැංකු ඇපකරයක් (Bank Guarantee) වශයෙන් තබා තිබූ රු.මිලියන 2,542.9 ක් වූ ස්ථාවර තැන්පතු හා 2009/2010 වර්ෂය සඳහා බදු අභියාචනා කොමිසම වෙත ගෙවිය යුතු රු.මිලියන 285 ක් වෙනුවෙන් වූ රු.මිලියන 315ක් වටිනා ස්ථාවර තැන්පතුවලට අදාල බැඳීම්, මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

2.2.2.2 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

**------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 02**

----------------------------------

භාවිතයට ගත නොහැකි තොග හඳුනාගෙන සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස කපාහැරීම වෙනුවට අධිකාරිය විසින් එහි පිරිවැය අවසන් තොගයට ඇතුලත් කර තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16**

**-------------------------------**

ප්‍රමිතිය ප්‍රකාරව හා වරාය අධිකාරියේ දේපළ , පිරියත හා උපකරණ ක්ෂය ප්‍රතිපත්තිය අනුව වත්කමෙහි ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය කරන රටාව අනුව ක්ෂය කළයුතු වුවත් රු. මිලියන 445 ක් වටිනා වත්කම්වලට අදාලව පැවරු දිනය නොසලකා ක්ෂයවීම් ගණනය කිරීම හේතුවෙන් ප්‍රවර්තන වර්ෂයේ ක්ෂයවීම් රු. මිලියන 77ක් වැඩිපුර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 24**

**-----------------------------------**

සම්බන්ධිත පාර්ශව සමඟ සිදුකරන ලද සියළු ගනුදෙනු අනාවරණය කළයුතු වුවත් පරිපාලිත සමාගමක් සමඟ අධිකාරිය විසින් සිදුකර තිබූ රු.මිලියන 114 ක් වටිනා ගනුදෙනු සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 36**

හානිකරණ ඇඟවීම් පවතින හම්බන්තොට තෙල් ටැංකි සංකීර්ණය හා මුහුදු බාදනයට ලක්වී තිබුණු ඔලුවිල් වරාය පවතින ඉඩම ඇතුළුව රු.මිලියන 208,181 ක් වූ වත්කම් වලට අදාලව හානිකරණ අලාභය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදුකර නොතිබුණි.

**(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 40**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරාය අධිකාරිය සතු රු.මිලියන 4,132 ක් වටිනා ආයෝජන දේපල සාධාරණ අගයට ඉදිරිපත් නොකිරීමට හේතු දැක්වීමකින් තොරව පිරිවැය ක්‍රමය යටතේ අගය කර තිබුණි.

### 2.2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙනුවෙන් සූරියවැව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනයේ නිර්මාණ හා ඉදිකිරීමේ කටයුතු මෙහෙයවීම, අධිකාරිය විසින් සිදුකර තිබුණි. මෙම ඉදිකිරීමට අදාලව කොන්ත්‍රාත්කරු හා අධිකාරිය අතර ඇති කර ගන්නා ලද කොන්ත්‍රාත් ගිවිසුම අනුව හම්බන්තොට වරාය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ විචලන නියෝග (Variation Order) යටතේ ඉදිකළ ඉහත ඉදිකිරීම් වෙනුවෙන් 2015 ජුලි 30 දින දක්වා වරාය අධිකාරිය විසින් කොන්ත්‍රාත්කරුට රු.මිලියන 2,070 ක් වූ පොළී මුදල් සමඟ රු.මිලියන 5,027 ක් ගෙවිය යුතු විය. මෙම මුදල වරාය අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු මුදලක් ලෙසත් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් ප්‍රතිපූර්ණය කරගත යුතු මුදලක් ලෙස ද හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) කොළඹ ජාත්‍යන්තර බහළුම් පර්යන්තය වෙත 2011 අගෝස්තු 12 දින බදු දී තිබූ ඉඩම හා නැගෙනහිර බහළුම් පර්යන්ත ඉඩම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2.4 අසම්භාව්‍ය බැරකම්

නැව් තෙල් තොග (Bunkering Oil) මිලදී ගැනීම සඳහා පරිපාලිත සමාගමක් විසින් පෞද්ගලික බැංකුවකින් ලබාගත් ඇ.එ.ජ.ඩොලර් මිලියන 28 ක ණය සඳහා වරාය අධිකාරිය සංස්ථාපිත ඇපකරු (Co-operate Guarantee) වූ අතර නැව් තෙල් තොග මෙහෙයුම් කටයුතු නවතා තිබීම හේතුවෙන් පරිපාලිත සමාගම විසින් ණයවාරික මුල්‍යයනය කිරීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය | අධිකාරිය විසින් මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 2,858 ක් ආයෝජනය කර තිබුණි. |

| | |
|---|---|
| (ආ) 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ 111(අ) වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.7 වගන්තිය | අධිකාරිය විසින් 2014/2015 බදු වර්ෂය සඳහා උපයනවිට බදු අදාල නිලධාරීන්ගේ වැටුපෙන් අයකර ගැනීමකින් තොරව අධිකාරියේ අරමුදලින් රු.මිලියන 376 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබුණි. |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ, | |
| (i) 7.2 හා 7.3 වගන්තිය | ආයතනයේ පාලන පරිසරයේ ප්‍රධාන අංගයක් ලෙස සියලු ප්‍රධාන මෙහෙයුම් ආවරණය වන පරිදි සකස් කරන ලද මෙහෙයුම් අත්පොතක් (Procedure Manual /System ) පිළියෙල කර තිබුණද ඒ සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාදී නොතිබුණි. |
| (ii) 7.4.5 වගන්තිය | අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් භෞතිකව සත්‍යාපනය කර තිබුණද ස්ථාවර වත්කම් ලේඛනය සමඟ සැසඳීමක් කර අවසාන වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. |
| (iii) 8.3.8 වගන්තිය | අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව විවිධ ආයතන වෙත රු.මිලියන 3 ක ප්‍රදාන ලබාදී තිබුණි. |
| (iv) 9.3.1 වගන්තිය | සෑම තනතුරක් සඳහාම විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් (Schemes of Recruitment) හා උසස් කිරීමේ පරිපාටියක් පිළියෙල කර තිබුණද ඒ සඳහා අදාල පාර්ශවයන්ගේ අනුමැතිය ලබාදී නොතිබුණි. |
| (ඈ) 2012 අප්‍රේල් 09 දිනැති අංක පීසීඑම්ඩී/ඒඩී/2/1/1/26 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛය. | චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව හම්බන්තොට තෙල් ටැංකි සංකීර්ණය විවෘත කිරීමේ උළෙල සඳහා සහභාගි වූ නිලධාරින් වෙනුවෙන් නවාතැන් හා හෝටල් ගාස්තු ලෙස රු.5,652,981ක මුදලක් වැය කර තිබුණි. |

## 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ මූල්‍ය කාර්ය පරිපාටි සංග්‍රහයේ 9.1.3 වගන්තිය අනුව අධිකාරියට ලැබිය යුතු මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් සෘජුව හෝ අනියම් ලෙස වගකිවයුතු නිලධාරින් ඒවා හිඟ මුදල් බවට පත්වීමට ඉඩ නොහරින බවට වගබලා ගැනීම සඳහා සෑම සැලකිල්ලක්ම දැක්විය යුතු වුවද වරාය අධිකාරියේ 2016 ජුනි 30 දිනට වර්ෂයකට වඩා වැඩි කාලයක් තිස්සේ අයනොවී පවතින වෙළඳ නැව් නියෝජිත ණයගැති ශේෂය රු.391,260,478 ක් ද වෙළඳ නොවන ණය ගැති ශේෂය රු.92,178,736 ක් ද විය.

(ආ) එකතුව රු.මිලියන 406 ක් වූ ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම සඳහා ලබා දී තිබුණු අත්තිකාරම් මුදලින් වසරකට වඩා පැරණි ශේෂය රු.මිලියන 96 ක් විය. මෙම අත්තිකාරම් 2016 මැයි 31 දිනය වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

3. **මූල්‍ය සමාලෝචනය**
**-----------------------**

3.1 **මූල්‍ය ප්‍රතිඵල - සමූහය**
----------------------------

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ සමූහයේ මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 14,580 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 7,947 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 22,527 ක හෙවත් සියයට 283 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වරාය ක්‍රියාකාරකම් ආදායම රු.මිලියන 804 කින් අඩුවීම හා ශුද්ධ විදේශ විනිමය ගැලපුම් අලාභය රු.මිලියන 20,496 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**මූල්‍ය ප්‍රතිඵල - අධිකාරිය**
----------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 14,169 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 8,897 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 23,066 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීම සඳහා පරිපාලන වියදම් රු.මිලියන 23,379 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සමඟ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ රු.මිලියන 57 ක්වූ ශුද්ධ ලාභය 2014 වර්ෂය දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණද 2015 වර්ෂයේදී එය රු.මිලියන 14,169 ක ශුද්ධ අලාභයක් බවට පත්වී තිබුණි. එහෙත් සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේ රු.මිලියන 20,768 ක්වූ දායකත්වය සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 31,044 ක් දක්වා වර්ධනය වී තිබුණි.

**3.2** **විග්‍රහාත්මක සමාලෝචනය**
**---------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ දී 2.5:1 ක් වූ ජංගම අනුපාතය 2015 වර්ෂයේ දී 1.5:1 ක් දක්වා පිරිහීමක් දක්නට ලැබුණු අතර ඉදිරියේ දී ආයතනයට කාරක ප්‍රාග්ධන ගැටළු මතුවිය හැකි බව නිරීක්ෂණය විය.

(ආ) ස්කන්ධ ප්‍රාග්ධනයට සාපේක්ෂව ණය ප්‍රාග්ධනය 2013 වර්ෂයේ දී සියයට 244 ක් වූ අතර 2015 වර්ෂයේ දී සියයට 312 ක් විය. මේ අනුව ආයතනයේ ණය ප්‍රාග්ධනය දිගින් දිගටම වැඩිවන බව හා ඒ මත දැරීමට සිදුවන ණය පිරිවැය ද වැඩිවන බව නිරීක්ෂණය විය.

4. **මෙහෙයුම් සමාලෝචනය**
**---------------------------**

4.1 **කාර්යසාධනය**
**----------------**

1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනත අනුව කාර්යක්ෂම හා අඛණ්ඩ වරාය මෙහෙයුම් සැපයීම හා ආරක්ෂක සේවා සැපයීම, ප්‍රවේශ මාර්ගවල යාත්‍රාකරණය විධිමත් කිරීම හා පාලනය කිරීම, වරායවල දියුණුව හා සංවර්ධනය , වරාය කටයුතු සම්බන්ධීකරණය කිරීම හා විධිමත් කිරීම අධිකාරියේ ප්‍රධාන අරමුණු විය.

ඉහත අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

## (අ) බහළුම්ගත නාවික යාත්‍රා පැමිණීම

ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ කොළඹ වරාය වෙත බහළුම්ගත නාවික යාත්‍රා 404 ක් හෙවත් සියයට 12 ක පැමිණීමේ වර්ධනයක් දක්නට ලැබුණු අතර 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේ කොළඹ වරාය වෙත පැමිණි බහළුම්ගත නාවික යාත්‍රා සංඛ්‍යාව 97 ක් හෙවත් සියයට 3ක වැඩිවීමක් දක්නට ලැබුණි. කොළඹ වරාය වෙත බහළුම්ගත යාත්‍රා පැමිණීමේ වර්ධනයක් දක්නට තිබුණ ද එම වර්ධනයේ වැඩි වෙළඳපොල කොටස වරාය අධිකාරියට අත්කර ගැනීමට අපොහොසත් වී තිබුණි. එම වෙළඳපල කොටස ක්‍රමානුකූලව පෞද්ගලික ආයතන දෙක විසින් අත්කර ගනිමින් පවතින බව පහත තොරතුරු මගින් තහවුරු වේ.

### බහළුම් යාත්‍රා පැමිණීම

| වර්ෂය | 2015<br>නැව් සංඛ්‍යාව | 2014<br>නැව් සංඛ්‍යාව | 2013<br>නැව් සංඛ්‍යාව | 2012<br>නැව් සංඛ්‍යාව | 2011<br>නැව් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| වරාය අධිකාරිය | 1,616 | 1,926 | 2,084 | 1,972 | 2,103 |
| එස්.ඒ.ජී.ටී | 1,026 | 855 | 1,011 | 1,120 | 1,084 |
| සී.අයි.සී.ටී | 1,001 | 458 | 47 | -- | - |
| | 3,643 | 3,239 | 3,142 | 3,092 | 3,187 |

*එස්.ඒ.ජී.ටී - දකුණු ආසියානු බහළුම් පර්යන්තය
*සී.අයි.සී.ටී - කොළඹ ජාත්‍යන්තර බහළුම් පර්යන්තය

## (ආ) බහළුම් මෙහෙයුම් විශ්ලේෂණය

| | 2015 | % | 2014 | % | 2013 | % | 2012 | % | 2011 | % |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **වරාය අධිකාරිය** | | | | | | | | | | |
| දේශිය | 541,152 | | 643,317 | | 676,937 | | 665,291 | | 647,482 | |
| ප්‍රති අපනයන | 1,691,267 | | 1,882,057 | | 1,779,882 | | 1,584,985 | | 1,583,195 | |
| වෙනත් | 19,904 | | 33,965 | | 45,044 | | 66,573 | | 68,769 | |
| එකතුව | 2,252,323 | 43 | 2,559,339 | 52 | 2,501,863 | 58 | 2,316,849 | 55 | 2,299,446 | 54 |
| **එස්.ඒ.ජී.ටී** | | | | | | | | | | |
| දේශිය | 327,750 | | 337,357 | | 341,510 | | 354,964 | | 399,404 | |
| ප්‍රති අපනයන | 1,028,538 | | 1,298,434 | | 1,385,552 | | 1,479,782 | | 1,540,633 | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| වෙනත් | 14,957 | | 26,152 | | 19,740 | | 35,525 | | 23,404 | |
| එකතුව | 1,371,245 | 27 | 1,661,943 | 34 | 1,746,802 | 41 | 1,870,271 | 45 | 1,963,441 | 46 |
| **සී.අයි.සී.ටී** | | | | | | | | | | |
| දේශිය | 349,069 | | 146,314 | | 13,530 | | -- | | | |
| ප්‍රති අපනයන | 1,168,516 | | 519,219 | | 42,683 | | -- | | -- | |
| වෙනත් | 44,314 | | 21,103 | | 1,328 | | -- | | -- | |
| එකතුව | 1,561,899 | 30 | 686,636 | 14 | 57,541 | 1 | -- | | -- | |
| **මුළු එකතුව (කොළඹ වරාය)** | 5,185,467 | 100 | 4,907,918 | 100 | 4,306,206 | 100 | 4,187,120 | 100 | 4,262,887 | 100 |

වරාය වෙත නාවික යාත්‍රා පැමිණීම හා එහි බහාළුම් කටයුතු මෙහෙයවීම පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂ හා සැසඳීමේ දී වාර්ෂිකව කොළඹ වරාය වෙත බහළුම් පැමිණීමේ වර්ධනයක් මෙන්ම ප්‍රතිනැව්ගත කිරීම හා යළි ඇසිරීම සඳහා පැමිණි බහළුම්වල වර්ධනයක් දක්නට ලැබුණ ද වරාය අධිකාරියේ බහළුම් මෙහෙයුම් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී සියයට 12 කින් පහත වැටී තිබුණි.

(ii) ඉහත වගුව අනුව සමස්ථ බහළුම් හැසිරවීම තුලින් වරාය අධිකාරිය සියයට 43 ක් ද දකුණු ආසියානු බහළුම් පර්යන්තය (S.A.G.T) සියයට 27 ක් ද කොළඹ ජාත්‍යන්තර බහළුම් පර්යන්තය (C.I.C.T) සියයට 30 ක් වශයෙන් වෙළඳපල දායකත්වයක් හිමිකරගෙන තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බහළුම් මෙහෙයුම් කාර්යක්ෂමතාව ඇගයීමේ දී වරාය අධිකාරියේ එක් සේවකයෙකුට බහළුම් සංඛ්‍යාව 1,388 ක් වනවිට කොළඹ ජාත්‍යන්තර බහළුම් පර්යන්තයේ (C.I.C.T) එක් සේවකයෙකුට බහළුම් සංඛ්‍යාව 6,323 ක් වී තිබුණි. එය 4.5 ගුණයක අගයක් විය. මේ අනුව පර්යන්ත බදු දී තිබූ සමාගම්හි කාර්යක්ෂමතාවය සමග වරාය අධිකාරියේ කාර්යක්ෂමතාවය සැසඳීමේ දී වරාය අධිකාරිය අඩු කාර්යක්ෂමතාවයකින් යුක්ත බව නිරීක්ෂණය විය.

(ඇ) හම්බන්තොට වරාය ඉදිකිරීම හා සංවර්ධන කටයුතු වෙනුවෙන් පළමු අදියර සඳහා රු.මිලියන 73,834 ක් ද දෙවන අදියර සඳහා රු. මිලියන 70,336 ක් ද වශයෙන් රු.මිලියන 144,170 ක මුළු වියදමක් 2015 දෙසැම්බර් 31 වන විට වැය කර තිබූ අතර ඒ සඳහා රු. මිලියන 129,849 ක විදේශ ණය මුදලක් ලබාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය වනවිට වාහන ප්‍රතිඅපනයනය සඳහා පමණක් වරාය භාවිතා කරන බැවින් දිගින් දිගටම පාඩු ලබමින් පැවතුණි.

4.2 **කළමනාකරණ ක්‍රියාකාරකම්**

-----------------------------------

ඔලුවිල් නාවික හා ධීවර වරාය ඉදිකිරීමෙන් පසු උතුරු ගොඩබිම අධික ලෙස ඛාදනයට ලක්වීම වැලැක්වීම සඳහා මීටර් 100 බැගින් වූ දියකඩන 3ක් යුරෝ මිලියන 1.8ක් වැයකර ඉදිකළ ද එම ඉදිකිරීම්වලින් ද ඛාදනය වීම වැලැක්වීමට නොහැකි වී තිබුණි. තවද වරාය මීටර් 9 ක් වැනි අඩු ගැඹුරක් සහිතව ඉදිකිරීම නිසා ඉතා කුඩා නාවික යාත්‍රාවලට පමණක් පැමිණිය හැකි අතර වර්තමානයේ ඔලුවිල් වරායේ අභ්‍යන්තරිකව අධික ලෙස වැලි පිරීම හේතුවෙන් වරායක් ලෙස තවදුරටත් ප්‍රයෝජනයට ගත නොහැකිවී තිබුණි.

4.3 **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වරාය අධිකාරිය විසින් ප්‍රතිඅපනයන හා අනිකුත් බහළුම් හැසිරීම් කටයුතුවල නිරතවන නැව් නියෝජිත ආයතන සමඟ ඇතිකරගත් ගිවිසුම්වලට අනුකූලව ධාරිතා අනුව ප්‍රතිදාන ලබාදීමේ දී, 1979 අංක 51 දරන වරාය අධිකාරිය පනතේ 37 (1) වගන්තිය ප්‍රකාර සමාලෝචිත වර්ෂයට අදාලව සකස්කළ අයක්‍රම ලේඛනයට පටහැනි වන ආකාරයෙන් රු.මිලියන 295 ක් ප්‍රතිදාන ලෙස නියෝජිත ආයතන වෙත ලබා දී තිබුණි.

(ආ) බහළුම් හුවමාරු පිළිබඳ වාර්තා (Equipment Interchange Report (EIR) ) සැකසීම් වරාය අධිකාරියේ කාර්ය මණ්ඩලය මගින් ඉටු කරවා නොගෙන පෞද්ගලික ආයතනයක් හරහා ඉටුකර ගැනීම හේතුවෙන් 2006 වර්ෂයේ සිට 2015 ජූනි දක්වා වාර්තා 6,174,580 ක් වෙනුවෙන් වරාය අධිකාරියේ ආශ්‍රිත සමාගමක් වෙත රු.මිලියන 538 ක් ගෙවා තිබුණි.

(ඇ) වරාය අධිකාරියට අයත් මාධ්‍ය ඒකකයක් තිබියදී හම්බන්තොට තෙල් ටැංකි සංකීර්ණය විවෘත කිරීමේ උත්සවය වෙනුවෙන් මාධ්‍ය කටයුතු සැලසුම් කිරීම, රූපවාහිනී වැඩසටහන් පිළිබඳ ලේඛන සැකසීම හා ගුවන් විදුලි වැඩසටහන් ලේඛන සැකසීම වෙනුවෙන් රු.79,208,867 ක මුදලක් බාහිර ආයතනයක් වෙත ගෙවා තිබුණි.

4.4 **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-------------------------------------

යුරෝ මිලියන 46.09 ක ණය මුදලක් ඩෙන්මාර්කයේ නෝඩියා බැංකුවෙන් හා වරාය අධිකාරියෙන් රු.මිලියන 531 ක් ද සමඟ වැය කර ඉදිකළ ඔලුවිල් නාවික හා ධීවර වරාය 2013 වර්ෂයේ දී විවෘත කර මේ වන විට වර්ෂ 3ක වඩා වැඩි කාලයක් ගතවී තිබුණ ද සමාලෝචිත වර්ෂ අවසානය වන විටත් වරායට කිසිදු නැවක් ගෙන්වා ගැනීමට අපොහොසත්වීම නිසා ආදායම් ඉපයීමට නොහැකි වී තිබුණි. මෙම වත්කම 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිෂ්ක්‍රීයව පැවතුණි.කෙසේ නමුත් මෙම වත්කමේ වටිනාකම වරාය අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොමැති වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

4.5 **ආර්ථික නොවූ ගනුදෙනු**

----------------------

වරාය අධිකාරියට සනීපාරක්ෂක, උපදේශන හා වෙනත් මෙහෙයුම් සේවා ඍජුව ඉටුකර ගැනීමට හැකියාව තිබියදී එම සේවාවන් අධිකාරියට අයත් ආශ්‍රිත සමාගම හරහා ඉටුකරවා ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී කොමිස් මුදල් ලෙස රු.මිලියන 6 ක් දරා තිබුණි.

4.6 **ප්‍රමාද වූ ව්‍යාපෘති**

--------------------

2006 මාර්තු 28 වන දින ශ්‍රී ලංකා රජය හා අන්තර් ජාතික සහයෝගිතාවය සඳහා වූ ජපාන බැංකුව (JBIC) අතර ඇති කර ගන්නා ලද ණය ගිවිසුම යටතේ, ජපාන රජය විසින් යෙන් මිලියන 14,495 ක් ගාල්ල වරායේ බහු කාර්ය පර්යන්තයක් සකස් කිරීම සඳහා ලබා දීමට එකඟ වී තිබුණි. විස්තරාත්මක සැලැස්ම නිර්මාණය කිරීම සහ තාක්ෂණික හා මූල්‍ය ඇගයීම් ඇතුළත්ව ව්‍යාපෘතියට අදාල පෙර ඉදිකිරීම් අදියර දක්වා සියලුම සේවාවන් නිමකිරීම වෙනුවෙන් විදේශීය උපදේශන සමාගමකට රු. මිලියන 549 ක් හෙවත් ජපන් යෙන් මිලියන 458ක් හා 2015 දෙසැම්බර් 31 දින දක්වා ණය පොලී ලෙස රු. මිලියන 13 ක් වැයකර තිබුණි. එහෙත් ව්‍යාපෘතිය සඳහා යුනෙස්කෝ (UNESCO) සංවිධානයේ අනුමැතිය ලබාගෙන ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

4.7 **වෙළඳපල කොටස**

----------------------

2015 වර්ෂය සඳහා ලෝක වරාය මෙහෙයුම් පිළිබඳව නිකුත් කරන ලද ඇල්ෆා ලයිනර් වාර්තාව (Alpha liner Report) අනුව කොළඹ වරාය විසිසම ඒකක (Twenty Equivalent unit) 5,185,467 ක මෙහෙයුම් සිදුකරමින් ලෝකයේ 26 වෙනි ස්ථානයේ රැඳී සිටි අතර 2014 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සියයට 5.7 ක වර්ධනයක් ලඟා කරගෙන තිබුණි.

පසුගිය වසර පහළොව තුල වරාය අධිකාරියේ බහළුම් හැසිරීම් ක්‍රමානුකූලව පහත වැටී තිබීම පහත වගුවෙන් දැක්වේ.

| වර්ෂය | S.L.P.A | ප්‍රතිශතය | S.AG.T | ප්‍රතිශතය | C.I.C.T | ප්‍රතිශතය | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 2001 | 1,396,946 | 86 | 229,670 | 14 | | | 1,626,616 |
| 2002 | 1,206,694 | 68 | 558,025 | 32 | | | 1,764,719 |
| 2003 | 1,334,900 | 68 | 624,439 | 32 | | | 1,959,339 |
| 2004 | 1,320,845 | 59 | 899,720 | 41 | | | 2,220,565 |
| 2005 | 1,523,794 | 62 | 931,526 | 38 | | | 2,455,320 |
| 2006 | 1,743,669 | 57 | 1,335,411 | 43 | | | 3,079,080 |
| 2007 | 1,834,734 | 54 | 1,546,497 | 46 | | | 3,381,231 |
| 2008 | 1,747,670 | 50 | 1,739,668 | 50 | | | 3,487,338 |
| 2009 | 1,714,488 | 49 | 1,749,809 | 51 | | | 3,464,297 |
| 2010 | 2,167,173 | 52 | 1,970,268 | 48 | | | 4,137,441 |
| 2011 | 2,299,446 | 54 | 1,963,441 | 46 | | | 4,262,887 |
| 2012 | 2,316,849 | 55 | 1,870,271 | 45 | | | 4,187,120 |
| 2013 | 2,501,863 | 58 | 1,746,802 | 41 | 57,541 | 1 | 4,306,206 |
| 2014 | 2,559,339 | 52 | 1,661,940 | 34 | 686,636 | 14 | 4,907,915 |
| 2015 | 2,252,323 | 44 | 1,371,245 | 26 | 1,561,899 | 30 | 5,185,467 |

ඒ අනුව වරායක ප්‍රධාන කාර්යය වන බහළුම් මෙහෙයවීමේ කාර්යය රාජ්‍ය වරායක් ලෙස වරාය අධිකාරියෙන් ක්‍රමානුකූලව ගිලිහී යමින් එය පුද්ගලික ආයතන විසින් නතුකර ගනිමින් පවතින බව නිරීක්ෂණය කෙරේ.

ඉහත තත්ත්වය ඇති වීමට ප්‍රධාන වශයෙන් ඉදිකර මෙහෙයුම් කර භාරදීමේ (Built , Operator, and Transfer) ක්‍රමය යටතේ වසර 35 ක කාලයක් සඳහා ඉහත පෞද්ගලික සමාගම් දෙකකට හොඳම හා ගැඹුරුතම (ගැඹුර මීටර් 15ක් හා මීටර් 18ක් වන ) නැව් තටාකාංගන දීර්ඝ කාලීන බදු පදනම මත ලබාදීම, දැනට වරාය අධිකාරිය සතුව මීටර් 15 ට අඩු නැව් තටාකාංගනයන් පැවතීම හා කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 10,800 ක පිරිවැයක් දරා 2015 වර්ෂයේ ඉදිකිරීම් අවසන් කරන ලද මීටර් 18ක් ගැඹුරැති නැගෙනහිර බහළුම් පර්යන්තයේ මෙහෙයුම් කටයුතු සඳහා

අවශ්‍ය දොඹකර හා අදාල අනෙකුත් උපකරණ මිලදී නොගැනීම හා සවිකර භාවිතා කිරීමේ තත්ත්වයට පත්කර ගැනීමට 2015 දෙසැම්බර් 31 දිනවන විටත් අපොහොසත් වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

5. **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

-------------------------------------

5.1 **අභ්‍යන්තර විගණනය**

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය 43 දෙනෙකුගෙන් සමන්විත වී තිබුණි. ඉන් විධායක හා මාණ්ඩලික නිලධාරින් 20 දෙනෙකුගෙන් 11 දෙනෙකුම ගිණුම්කරණය හා විගණනය විෂයය පිළිබඳ වෘත්තීය දැනුමක් නොමැති නිලධාරින් වූ අතර විධායක තනතුරු 04 ක් සමාලෝචිත වර්ෂයේ පුරප්පාඩු වී තිබුණි. මේ හේතු නිසා සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්මෙහි අන්තර්ගතයන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් ආවරණයක් කිරීමට අපොහොසත් වී තිබුණි.

(ආ) 2010 ජුලි 26 දිනැති අංක ඩීඑම්ජී/2010(5) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය අනුව විදේශාධාර හෝ දේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතු වුවත් වරාය අධිකාරිය විසින් විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

5.2 **පාරිසරික හා සමාජ වගකීම ඉටුකිරීම**

-----------------------------------

ඔලුවිල් වරාය ඉදිකිරීමෙන් පසු මුහුදු ඛාදනය උග්‍රවීම හේතුවෙන් මුහුදු වෙරළ ආශ්‍රිතව ජීවිකාව ගෙන ගිය ධීවර ජනතාවට තම දෛනික ක්‍රියාකාරකම්වලට බාධා සිදු වී තිබුණි. එමෙන්ම මීටර් 100 ක් දක්වා වූ දියකඩන 03ක් ඉදිකිරීම හේතුවෙන් ධීවර බෝට්ටු නවතා තැබීමට නොහැකිවීම මත ද සම්ප්‍රදායික ධීවරයන්ට තම වෙරළ තීරය භාවිතයේ දී ගැටළු මතු වී තිබුණි.

6. **පද්ධති හා පාලනයන්**

---------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු විය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | කාර්ය මණ්ඩල පරිපාලනය | බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කර නොගැනීම. |
| (ආ) | ගිණුම්කරණය | ගිණුම්කරණ ප්‍රමිතිවල අවශ්‍යතාවයන් ඉටු නොකිරීම. |

| | | |
|---|---|---|
| (ඇ) | ණයගැති පාලනය | දීර්ඝ කාලීනව අයකර නොගත් ශේෂ පැවතීම. |
| (ඈ) | අභ්‍යන්තර විගණනය | විගණන වැඩසටහනෙහි අන්තර්ගත කරුණු පිළිබඳ ප්‍රමාණවත් ආවරණයක් සිදු නොකිරීම. |
| (ඉ) | තොග පාලනය | භාවිතයට ගත නොහැකි අයිතම වෙන්කර හඳුනා නොගැනීම. |